# ප්‍රභාකරන් නැති පාඩුව - කතා තුනක්



http://www.loopholesblog.org/

## ගොතපු නෙමේ අහපු ඇත්ත කතා තුනක්.

### 1.

මරණය අතේ තියාගෙන හිටියත් ලොක්කගේ ඉඳලා සොක්කා දක්වාම ආරක්ෂක හමුදාවල හිටය කට්ටියට යුද්දෙ කියන්නෙ හැම ආකාරයකම සැප උල්පතක්. යුද්දෙ ඉවර වුණා විතරයි ලොක්කන්ට සැප ඉතුරු වෙලා සොක්කන්ගෙන් මේ සැප කෑල්ල ගැලවුණා විතරක් නෙමෙයි තැන තැන පීචං වෙන්නත් සිද්දවුණා. පාරවල් හැදිලි, වල් කෙටිලි, බදාම ඇනිලි, මුට්ට කර ගැහිලි එකී මෙකී නොකී සියළු ආකාරයේ කට්ටවල් මේ දවස්වල අපේ රණවිරු සොල්දාදුවෝ කනවා එපා නොකියන්න. කන්දොස්කිරියාවල කෙළවරක් නැහැ.

සාජන්ල කැප්ටන්ල සෝල්ජර්ස්ලගෙන් හරකුන්ගෙන් වගේ වැඩ ගන්නකොට අරූං නාහෙන් අඬනවා මොකක්ද සර් මේ කරුමෙ කියලා. ඒ වගේ වෙලාවක ආමි එකේ එක ගජබා කැප්ටන් කෙනෙක් මෙහෙම කිව්වලූ.

"තොපි අපි හැමෝටම තාත්ත කෙනෙක් වගේ සැප සම්පත් දීපු අර මනුස්සයව මරා ගත්තනම් හු.... පුතාල දැං ඉතිං ගල් කඩාපියව්"

තාත්තා කෙනෙක් වගේ කිව්වෙ ප්‍රභාකරන්ට.

### 2.

උතුරු නැගෙනහිර වනාන්තර කියන්නෙ කොටි සංවිධානයේ දැඩි නීති යටතේ යුද්දය ඉවර වෙනකම්ම හොඳින් ආරක්ෂාවුණු වනාන්තර කලාපයක් බව කොටි සංවිධානයට එරෙහිව මතවාද දරණ අයගේ වුවත් පිළිගැනීමක්. කපන කපන ගහක් ගානේ නැවත පැල සිටුවීම පමණක් නොවෙයි ඒවා නිසි පරිදි උස මහත් වෙනතම් රැක බලා ගැනීමත් වගකීමෙන් යුක්තව සිදුවුණා. හොරෙන් ගස් කපන්නන්ට දැඩි දඬුවම් ලැබුණා.

ඒත් යුද්දෙ ඉවර උනත් හරි සිංහල දේශපාලුවො ආණ්ඩුවේ අනුදැනුම ඇතිව ඒ පලාත් වල ගස් කපන්න ගත්තෙ හිටු කියල. ජාතික වනාන්තර බහුජාතික සමාගම් වලට විකුණල දාන්නෙ අම්මා අප්පගේ බූදලය වගේ.මේ යන විදියට වැඩි කලක්

නොගිහින්ම එක පැලයක්වත් ඉතුරු වෙන්නෙ නැති බව මෙන්න මේ ටිකත් එක්කම කිව්වේ ගහකොළ මත්තෙම නැහෙන පරිසර හිතකාමියෙක්.

"අර යකා රටෙන් කෑල්ලක් ඉල්ලුවා තමයි. ඒ වුනාට මචං රුක් දෙයියෙක් වගේ ඒ මනුස්සය රැක බලාගත්ත කැලෑ ටික....මුං වනසනවා පුතෝ උතුරු නැගෙහිර සහරාව වෙනකම්මී"

### 3

යූඑන්පී එක ඉවරයි. ෆොන්සේකා ඔරු කඳේ පාරු කවි කියනවා, ජවිපෙ පණ අදිනවා, වැඩක් වෙයි කියල හිතුවට පෙසපෙ කරන කියන දෙයක් උන් වත් දන්නෙ නැතිව ළදරු මරණනෙකට ගොදුරු වෙලා. මිනිස්සු හැමෝම තම තමන්ගෙ පාඩුවෙ ගතමනාවක් හොයාගෙන පවුලෙ වැඩක් බලාගෙන ටෙලියක් වැඳගෙන ගෙවල් අස්සසෙම ඉන්නවා. කවදාද මේ රාජපක්ෂ කරුමෙන් ගැලවෙන්න කියන බලාපොරොත්තුවක් තියාගන්න මොකෙකුටවත් පුළුවන් කමක් නැහැ. ඒ වගේ නන්නත්තාර වෙලා ගිය අපේ හිතවතෙක් මෙහෙම කිව්වා.

"ඉස්සරත් මෙහෙම කාලවල් තිබුණා බං ගැලවීමක් පේන තෙක්මානෙක වත් නැති. ඒත් මොකක්ම හරි බලාපොරොත්තුවක් තිබුණා මරාගෙන මැරෙන එකෙක්වත් ඇවිල්ල බදාගෙන මුංව වාශ්ප කරල දායි කියල. දැං ඉතිං හිටපියව් ඇටි කෙහෙල් කාපු එවුන් වගේ..... හාට් ඇටෑක් එකක් වත් වරෝ.....කියලා හිත හිතී"

# වෙස්සන්තර රජතුමා

පතිරණ මැණිකේ මුණසිංහ

බෝසත් උතුමා බුදුබව ලැබීමට පෙර අන්තිම ආත්ම භාවය වෙසතුරු රජුව උපත ලැබීය. ඉන්පසු සිදුහත් කුමරු නමින් මනුලොව පැමිණ බුදුබවට පත්වීය.

බෝසත් වෙසතුරු උතුමා : ජයතුරා නුවර සිව්රට සඳමහ රජුට හා එම බිසවට පුත්‍රයාව උපත ලබා සැපසේ වැඩුනේය. රට වැසියන්ට බොහෝ උදව් උපකාරද කරමින් දන්දීම ගැන පැතිරි ගියේය. මේ බව දැනගත් කලිගු රට බමුණෝ අට දෙනෙකු පැමිණ මෙසේ කීය. රජතුමනි ! අප රටේ මහා නියගයකි: දුර්භික්ෂයකි : රටේ යහපත පිණිස සුදු



ඇතු ගෙනයාමට අපට දෙන්නයි ඉල්ලීය. සිතුමිණ වැනි සෞභාග්‍යමත් වාසනා මග නදෙන, කෛලාසකූට ජර්වතය වැනි සුදු ඇතු කළිගුරට බමුණන්ට දන් දී දන පාරමිතාව සම්පූර්ණ වීය.

මේ පිංවත් ඇත් රජු කුඩා වයසේදී ඇත් අම්මා කෙනෙකු පැටවා එහි තබා කැලයට ගියේලු. හොඳින් වැඩු ඇතු පණ්ඩර නම් වීය. වාසනාව වෙසතුරු රජුගේය. ඇතු රටටම වාසනාවන්ත විය. දන පාරමිතාව පූර්ණ වීමට ලැබුණ දයදයකි.

ඇතු දන් දුන්නේය. කළිගු රටට ගෙන ගියේය. ජයතුරා රට ගය වට කලෙන් වෙසතුරු පුතු රටින් පිංමං කිරීමට පිය රජුට සිදුවීය. වෙසතුරු පුතුනේ රටවැසියෝ කෝප වී ඇත. රටින් පිටවීමට සිදු වී ඇතයි, දුක් වේදනා ඉවසා දරාගෙන දැන්වීය. ඔව්, පියානෙනි ! දෝත් මුදුන් දී පියාට වැඳ සමාව ගෙන කලපිණ අනුමෝදන් කර බුද්ධ රාජ්‍ය ලැබේවයි ප්‍රර්ථනා කර පිටවීමට සූදනම් විය. වංකගිරිය බලා පිටත් වනද මංද්‍රි දේවියත් දරු දෙදෙනාත් කැටුවයාමට අකමැති වී කටුක දුක් නුපුරුදුය, දරුදෙදෙනා සමඟ ඔබ මාළිගාවේ රැඳෙන්න දේවියට අණක් පැනවීය. ස්වාමීනි අප දමා නොයන්න. හඬා වැටුන මංද්‍රි දේවියද ගමනට දරුවන් සමඟ පිටත් වුයේ මව්පියාගේ වැලපීම් මැදය. සිදු වූ විපත දරාගත නොහැකි රටවැසියෝද අඳෝනා නැගීය.

සියළු සම්පත් හැරදමා අඟ පසඟින් හොබනා මංද්‍රි දේවිය දරු දෙදෙනා සමඟ වංකගිරිය බලා පිටත්වීය. හිස් වූ මාළිගය දුටු සීයා - අත්තම්මා වැලපුනද ගමන එසේම සිදුවීය. රට වැසියෝ කලාන්ත වීය සහ අතරමගදී අජානේය අසුද දුන්නේය. හමු වූ ගංතෙර ලඟ නතරව ගිමන් නිවීය. දරුවෝද තුරු සෙවනේ නිදති. පිංවත් මංද්‍රි දේවිය සසර පුරුද්ද අනුව මව්:පියන් පැදකුණු කල හැටි සිහිවීය නෙත්කසු හෙම්හිට පිසදගති. ක්‍රිෂණජිනා තම උකුලේද ජාලිය වෙසතුරු පිය උකුලේද හොවමින් යන අතර මෙය දුටු දෙවියෝ මේ අසිරිය දැක දැක සාදුකාර දී ඇත.

දෙවියෝද ආශිර්වාද කර ඇත. සැමවිටම පිහිට වී ඇත. මග පෙන්වා ඇත. අතරමඟ සෙනඟ මේ අය පිරිවරා කරුණු විමසා ඉතා සියුමැලිය. පිංවන්තය. මේ අරනෙහි පාගමනින් ආවේ දැයි පුදුම වීය. පිටමං වු කරුණු විමසීය. සිව්රට සෞභාග්‍යවත් වාසනා උදකරන ඇත්රජු කෛලාසකූට පර්වතය වැනි හස්තියා කළිඟු රට වැසියනට දන් දී පාරමිතා පූර්ණ කල බව හමු වූ අයට කීය. පිංවත අප රටේ වාසය කල මැන. ආරාධනා වීය. පිංවත් වැසියනි ! මා වංකගිරියට යා යුතුමය. තවත් රටක නොවසමි. පවසා පිටත්වුයේ වැසියන්ගේ කඳුළු දැක දැකය. එ රටේ රජු වෙසතුරු රජුට මඟ සලකුණු මෙසේ කීය. උතුරු දිග බලා යනු. පර්වත පාමුල ගඟකි. දිය නා ගිමන් නිවා ගන්න. මධුර ඵල ඇති නුග රුකක් ඇත. හෙල පියුමින් පිරි විලෙකි. ඉන් එහා ළිහිණි ගැවසී ගත් වනයකි. මල් පිරි ගස් තුරුලතා ඇත. ශෛලීය පර්වතයකි. පලදරන ගස්ය. බොහෝ මසුන් ගැවසීගත් මනහර පොකුණකි. ඊසාන දිගින් පංසලක් තනාගෙන වාසය කරවයි, එම සෑ රටේ රජු විසින් ඔබට යහපතම වේවයි ප්‍රාර්ථනා කර ඇත. මෙසේ ආශිර්වාද ලබමින් පිටත් වී වංකගිරි බලායන්නේ අතරමගදී දරුවන් තාත්තේ අපට අර පලතුරු ඕනි කියා ඉල්ලුවිට බෝසතුන් අත දිගු කරත්ම අතුපාත්වන්නේ දෙවියෝද මේ සමඟය. ඒ දුටු දේවිය ස්වාමීනි ! ඔබතුමා දැන් බ්‍රහ්මණයෙකු වගේය. මටත් පැවිදි බව දෙන්න. මේ ආකර සුදුසු ස්ථානයට පැමිණ ඇත. බිම පවිත්‍රකර රැගෙන ආ සෙව්ලිය යොද කුටිය සාදගති. මද දුරකින් දේවියට දරුදෙදෙනාට තව කුටියකි. දේවිය ! ඔබ ආවේලාවේ කුටියට එන්න එපා. මේ ලෙස මසක් ගත වී, මේ කාලයේ දේවිය පලවැල නෙලා එන්නේ දෙවියන්ගේ උදව්ද සමඟය. දිනක් බයංකාර සිහිනයක් දේවිය දිටිව. ස්වාමීනි දුටු සීනයකි බිය ගෙනදේ. දරුවන් මා එනතුරු බලාගන්නයි අහර සොහා වනයට ගියාය. මේ අතර ජුතක බමුණා පැමිණ රජුගෙන් දරුවන් ඉල්ලීය. දේවිය එන්න පෙර මා යා යුතුයි. රජුනි ! දරුවන් මට දෙන්න. යන හඬ ඇසී දෙදෙනාම පොකුණට බැස සැගවුනි. නෙළුම් කොලින් මුණ වසා ගති. පුත ජාලිය මෙහි එන්න, හඬ ඇසිනි. පියා වෙහෙසකර නොහේ කියා ලඟට ආවේය ! පියා සිද්ධිය කී පසු තිදෙනාගේ නෙත් කඳුලින් පිරුණි. පියාගේ කඳුළු පියා පායුග වඳින දරුවන්ගේ පිටමත වැටී ඇත.

ප්‍රිය දරුවනේ! මට බුදුබව ලබන්න පිහිට වෙන්න, කීයෙන් සාදුකාර දී මේ දරු දෙදෙනා ජුතක බමුණ සමග ගියා. මව් බිසව මග වැරදී ඇවිදින්නේ පාරමිතාව පූර්ණ වන තුරු දෙවියන් රජුට උදව් වුයෙනි. දේවිය ආවේ නම් දරුවන් දිය නොහැක. එන මග ඇසිරීය. ප්‍රමාද වී ආවා, දරු දෙදෙන නැත විලාප තියමින් ඇසුවා. බැරිම තැන රජු සිද්ධිය කීවා. අප දරුවන් දන්නේ බුදුබවට නම් එසේම වේවා සාදුකාර දී ඇත. මේ බලා සිටි සක්‍ර දෙවියෝ මනු වෙසක් ගෙන දේවිය ඉල්ලා ආවා. දේවියත් දුන්න. දෙවියෝ දරුවන්ට කෑම දුන්නා, ජුතකට එය නොදිරවා අතරමඟදී මියගියා. සීයා සඳ මහරජු දරුවන් සොයා ආවා. දෙවියෝ දරුවන් මුණගැසු බවයි.

